# සමනළ පාඩම



කතාව හා චිත්‍ර

උත්‍රාදි සමද්යා අතුකෝරල

කෘතියේ නම : සමනල පාඩම

ප්‍රථම මුද්‍රණය : 08-02-2025

කතාව හා චිත්‍ර : උත්‍රාදි සමද්‍යා අතුකෝරල

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය

ශ්‍රේණිය : 3 ශ්‍රේණිය D

ISBN අංකය : 978-624-208-747-4

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිඳුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

මේ පොත

ලොකුඅත්තාට

සහ

අත්තම්මාට..





ලා හිරු එළිය වැටිලා මම ඇදෙන් නැගිට්ටා. මිදුලට දිව්වා. මගේ රෝස පදුර ලගට.

රෝස පඳුර තියෙන්නේ ලොකු පෝච්චියක. එයාට වතුර දාන්නේ මමයි. පිරිසිදු කරන්නේ අම්මා. බෙහෙත්, පොහොර දාන්නේ අප්පච්චියි.



අද රෝස මල් ගොඩක් පිපිලා. හරිම සුවඳයි ලස්සනයි රතුම රතු පාටයි. මම වටපිට බැලුවා. කෝ? අද වෙනදා එන කෙනෙක් පේන්න නැහැනේ.හරිම දුකයි. මම ගෙදර ඇතුලට එන ගමන් මම හැම තැනම බැලුවා.



මොකද වෙනදා උදේටම එන කෙනා ආවේ නැත්තේ ? අන්න, අන්න එයා දුරින් තියෙන සමන්පිච්ච වැලේ ඉන්නවා.

මම එතනට දුවගෙන ගියා. එයා එතනින් ඈතට ගියා.



මගේ ඇස් කඳුලු වලින් පිරුණා අම්මා දැක්කා.

"මොකද? දුවේ," අම්මා ඇහුවා.

"අම්මේ, වෙනදා එන මගේ යාළුවා අද මාව දැක්කම දුරට ගියා." අම්මා හිනා වුනා.

"බලන්න, අද ඔයාගේ වෙනස. ඔයා දත් මැදලා නැහැ. මුහුණ සෝදලා නැහැ. හිසකෙස් අවුල් වෙලා. වෙනදට ඔයා යන්නේ ඔහොම නොවෙයි" අම්මා කීවා.



මට වැරැද්ද තේරුනා. මම ගෙට ගියා. දත් මැදලා මූහුණ සේදුවා. ලස්සන ඇඳුමක් ඇදලා හිසත් පීර ගත්තා.

මම මිදුලට ආවා. අන්න ඈත හිටිය කෙනා හෙමින් හෙමින් එනවා. සමන්පිච්ච වැලෙන් රෝස පඳුරට ආවා. මමත් රෝස පඳුර ළගට දිවුවා. එයා රෝස මල් වලට යනවා. මගේ වටෙට කැරකෙනවා. හරිම විනෝදයි. එයා නිල්පාට ලස්සන සමනළයෙක්.



අම්මා අපි දිහා බලාගෙන ඉන්නවා. අපි රෝස පඳුර වටේ දුවනවා.

“දුවත් රෝස මලක් වගේ ලස්සනයි, සුවඳයි.”

“පේනවා නේද? සත්තු වුනත් කැමති පිරිසිදුවට, ලස්සනට, යහපත්ව ඉන්න අයට.ඔයා ඒක අද දැන ගත්තා.” අම්මා කීවා.



නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්